# නිශාචර ලෝකය



සෙනුලි රශ්විතා මෙනන්

# නිශාචර ලෝකය

සෙනුලි රශ්විතා මෙනන්

වෙනත් කෘති

- අපේ සීයා තාත්තා සුරංගනා ලෝකයට ගිය හැටි
- සමනල කඩය
- බිය වුන පූස් රාළ
- ඔයයි මමයි
- සූර වීර යකා පැංචා
- පුංචි හොරෙක්
- All about me 1
- All about me 2 + 3
- 10 Verses 1 Heart

2026 May 10
ISBN 978-624-211-293-0

## පිදුම

මට හැමදා ආදරේ කරන අම්මා, තාත්තා, නංගී ඇතුළු
පවුලේ සියලු දෙනාටත්, මගේ සියලුම යහළුවන්ටත්
මට සිප් කිරි පෙවූ සියලු ගුරු මෑණිවරුන් සහ පියවරුන්ටත්
ග්‍රන්ථකරණය සඳහා නිරන්තරයෙන් අප දිරිමත් කරන
සෙනෙවිරත්න ගුරු පියාණන් සහ අපගේ විදුහල්පතිතුමියට
මාගේ මේ කෘතිය වන "නිශාචර ලෝකය" බැති සිතින් පුදමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සදහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිමර්ාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිමර්ාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිමර්ාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාථර්ක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිවර්ාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාථර්කත්වයක් ලබනු ඇතැයි ප්‍රාථර්නා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචායර් , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූණර් පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිමර්ාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවධර්නය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිමර්ාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාථර්ක වේවායි මම ප්‍රාථර්නා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

# පටුන


පිටු අංකය

★ හැඳින්වීම 1

★ ක්‍රමවේදය හා භාවිතා කළ උපකරණ 2

★ නිරීක්ෂණ

- නිශාචර ලොවේ ඇරඹුම - i 3
- නිශාචර ලොවේ ඇරඹුම - ii 4
- පළමු අත්දැකීම - බය - i 5
- පළමු අත්දැකීම - බය ජයගනිමි - ii 6
- ඇසුණු ශබ්ද 7
- දළඹු දැල 9
- අරුම පුදුම වවුලා 10
- ඉත්තෑවා 11
- මීයා 12
- ගෙම්බා 13
- නිදන ගස් 14
- නිශාචර ලෝකය සුවඳවත් කරන මල් 15
- හඳ - ආවාට 16
- දැනුණු දේ 17
- හඳ - වෙනස් වන හැඩය 18
- හඳෙහි ඡායාරූපය 19
- තරු හා ග්‍රහලෝක i 20
- තරු හා ග්‍රහලෝක ii 21
- වර්ණවත් තරු 22
- තරු රටා 23

- කෘතිම ආකාශ වස්තු 24

- රාත්‍රිය නිමා වෙයි 25

★ නිගමන 26

★ ලබා ගත් අත්දැකීම් සහ දැනුම 27

★ මුහුණ පෑ ගැටලු සහ ඒවා නිරාකරණය කර ගැනීමට යොදා ගත් උපක්‍රම 28

★ පරිසර අධ්‍යයනය ආශ්‍රිත අනාගත සැලසුම් 29

# හැඳින්වීම

කුඩා කාලයේ සිටම පරිසරයේ රසවත් දේ සොයා බැලීමට මම ඉතා ආශා කළෙමි. අන්ධකාරයට බිය වුණත් රාත්‍රිය සුන්දර කරන හඳ, තරු, මල් සහ අමුතු සතුන් ගැන දැන ගැනීමට මාගේ හිත තුළ කුතුහලයක් ඇති විය. එම නිසා මාගේ පරිසර ව්‍යාපෘතියට "නිශාචර ලෝකය" (The world of night) යන මාතෘකාව තෝරා ගත්තෙමි

**ක්‍රමවේදය**

මම සෑම දිනකම රාත්‍රියේ එකම වේලාවට නිවසේ මිදුලේ හෝ උඩු මහලේ සිට ගස් වැල්, මල්, ආකාශය සහ සතුන් නිරීක්ෂණය කළෙමි. ඇස් වසා ගෙන ඇසෙන ශබ්දවලට සවන් දුන්නෙමි, දැනෙන දෙයට අවධානය යොමු කළෙමි.

භාවිතා කළ උපකරණ හා වෙනත් දෑ

දූරදර්ශකය


අත් කාචය

පොත් පත්

අන්තර්ජාලය

තාරකා විද්‍යා සංගමයෙන් ලද දැනුම

විදුලි පන්දම



| දිනය: 2024.07.01 | වේලාව: ප.ව. 5.45 |
|---|---|
| කාලගුණය: උණුසුම් | ස්ථානය: උඩු මහල |

## නිශාචර ලොවේ ඇරඹුම !





ඉර කඳු අතරින් බැස යන තුරු මම නිසොල්මනේ බලා සිටියෙමි. එහි දී පහත දැක්වෙන විශේෂ කරුණු කිහිපයක් මම නිරීක්ෂණය කළෙමි.

i) මම බලා සිටිය දී කෙටි කාලයක් තුළ ඉර බැස ගියේ ය.

ii) බැස යන හිරුගේ රශ්මිය අඩු බැවින් ඉතා හොඳින් ඉර දිටිමි.

iii) හිරු වටා ඇති රැස් දහරා ඉතා හොඳින් නිරීක්ෂණය විය.

iv) හිරු වලාකුළුවලට මුවාවීමෙන් ඇති විට සූර්ය හැඩය මැනවින් පෙනේ.

| දිනය: 2024.07.02 | වේලාව: ප.ව. 5.45 |
|---|---|
| කාලගුණය: උණුසුම් | ස්ථානය: උඩු මහල |

## නිශාචර ලෝකයේ ඇරඹුම ii



i) හිරු බැස යන අහස පිළිවෙලින් කහ, තැඹිලි හා රතු පාට ලෙස වෙනස් වෙයි. එහිදී සූර්ය වර්ණාවලියේ තිබෙන නිල් සහ දම් වර්ණ නොපෙනෙයි.

එයට හේතුව:

A) සවස් කාලයේ දී සූර්ය ආලෝකය වායු ගෝලයට පතිත වන්නේ සුළු කෝණයකිනි.

B) එවිට සුදු පැහැති ආලෝකය වර්ණවලට වෙන් වෙයි.

C) කහ, තැඹිලි සහ රතු වර්ණවලට දුර ගමන් කළ හැකි අතර නිල්, දම් වැනි පාටවලට ගමන් කළ හැක්කේ ඉතා කෙටි දුරකි.

(★ ඉහත කරුණු අන්තර්ජාලයෙන් සොයා ගත්තෙමි.)

| | |
|---|---|
| දිනය: 2024.07.03 | වේලාව: ප.ව. 9.00 |
| කාලගුණය: මද වැසි | ස්ථානය: ගෙවත්ත |

## පළමු අත්දැකීම - බය - i



මම තාත්තා සමඟ රාත්‍රියේ වත්තේ කෙටි දුරක් ඇවිද්දෙමි. එවිට කළුවර දුටු මට විවිධ සිතිවිලි පහළ වුණි. මට මහා බියක් දැනුණි. සීතල සුළඟ ඇඟේ වදිද්දී මට හොල්මන් කඩා පනී දෝ සිතුණි. හූනන්ගේ ශබ්ද ඇසුණි. මට රාත්‍රී නිරීක්ෂණය අත හැර දමන්නට සිතුණි.

ඇයි රාත්‍රියට පමණක් බය දැනෙන්නේ?

දවල් කාලයේ එළිය තිබෙන බැවින් හොඳින් වටපිට පෙනෙයි. නමුත් රාත්‍රියේ අඳුර නිසා කිසිවක් නොපෙනෙයි. සැඟවුණු යමක් ඇති දැයි සැක සිතෙන නිසා බියක් ඇති වෙයි. කොහොමද බිය පලවා හරින්නේ?

| දිනය: 2024.07.05 | වේලාව: ප.ව. 9.00 |
| --- | --- |
| කාලගුණය: මද වැසි | ස්ථානය: ගෙවත්ත |

## පළමු අත්දැකීම - බය පරදවමු - ii



පළමු දවසේ ඉතා බියෙන් සිටියත් දෙවන දවසේ යම්තාක් දුරකට බය අඩු වී තිබිණි. රාත්‍රියට හුරු වූ නිසා බය අඩු වූ බව මට තේරුණි. මම තැති ගනිමින් සිටියත් තාත්තා නිහඬව සිටියේ ය. එයින් මම සොයා ගත්තේ භයානක දේ තිබෙන්නේ එළියේ නොව බිය තිබෙන්නේ මාගේ ම හිත තුළ බවයි.

පළමු දවසේ ම රාත්‍රී ගවේෂණය අත්හැර දැමීමට සිතුණු මට, දෙවන දවසේ සිතුණේ රාත්‍රී ගමනට දැඩි කුතුහලයකි.

| | |
|---|---|
| දිනය: 2024.07.06, 07 | වේලාව: ප.ව. 8.45 |
| කාලගුණය: මද වැසි | ස්ථානය: ගරාජය |

# ඇසුණු ශබ්ද



මම තාත්තා සමග රාත්‍රියේ ඇස් වසාගෙන නිදහසේ ඇසෙන ශබ්දවලට ඇහුම්කන් දුන්නෙමි. රාත්‍රියේ ඇසෙන සියලුම අමුතු ශබ්ද සොයා ගැනීම මාගේ අරමුණ විය. මට ඇසුණු ශබ්ද....


a) සුළඟට ගස් සෙලවෙන ශබ්දය (සිරි... සිරි... සිරි.....)
b) රැහැයියන්ගේ ශබ්ද (ක්‍රිං.... ක්‍රිං....) , (කීර්...........)
c) ගෙඹි හඬ (බක... බක.... බක....)
d) වවුලන් තටු ගසන හඬ (චට... චට.... චට....)
e) බල්ලන් බුරන හඬ (බව්.... බව්.. වව්.. වව්....)
f) ඉඳ හිට ඇසෙන වාහන ශබ්ද (පීප්.. පීජ්.) (බිරූම්....)

මේ හැර වෙනත් ශබ්දයන් තිබේද? ......

★ මේ හැම ශබ්දයක්ම පිටුපසම තිබෙන, නිශ්ශබ්දතාවය

| | |
|---|---|
| දිනය: 2024.07.08 | වේලාව: ප.ව. 9.00 |
| ස්ථානය: ගරාජය | කාලගුණය: මඳ වැසි |

## දළඹු දැල



රාත්‍රී කාලයේ සතුන් නිරීක්ෂණයට ගිය මම දුටුවේ අමුතු සිදුවීමකි. කුඩා දළඹුවෙක් අහසේ පාවෙනවා. ළං වී බැලූ විට, ඌ දිග දැලක එල්ලී සිටින සේ පෙනුණි. දළඹුවා ඒ මේ අත නලියන විට ක්‍රමයෙන් උඩට ඇදෙන බව පෙනුණි. මකුළුවෙක් දැලකින් ඌව ඇදගන්නවා දැයි මට සිතුණි. සෝදිසි කළ මට මකුළුවෙක් හෝ මකුළු දැලක් සොයා ගැනීමට නොහැකි විය. තවත් ළං වී බැලූ මට පෙනුණේ දළඹුවා දැල ගිලිමින් උඩට යන බවයි. අන්තර්ජාලයෙන් සොයා බැලූ මට ඇතැම් දළඹු විශේෂ මුඛයේ ඇති විශේෂ ග්‍රන්ථියකින් නූලක් නිපදවා තැනින් තැනට යන බව සොයා ගතිමි. හදිසි අවස්ථාවකදී දළඹුවා දැල භාවිතා කරයි. (ගසකින් වැටුණු විට)

| දිනය: 2024.07.09 | වේලාව: ප.ව. 9.30 |
| --- | --- |
| කාලගුණය: උණුසුම් | ස්ථානය: උඩු මහල |

## ඌරා



මට වත්තේ සිට නහයෙන් සෙම අදින්නා සේ ග්‍රෑ... ග්‍රෑ... යැයි ශබ්දයක් ඇසුණි. මම දුටුවේ ඌරු රංචුවකි. එහි සිටි විශාලම ඌරා බල්ලන් දෙන්නෙකු තරම් විශාලය. මා දුටුවත් ඌරෝ කලබල නොවී නිසොල්මනේ සිටියහ. උන්ට උගුර නොපෙනුණු කෙටි වලිගයක් තිබුණි. උන්ගේ ඇස් කහ පැහැති බල්බ් දෙකක් මෙන් දිස්වුණි. ඌරාගේ නාසය ඉතාම කොට හොඬ වැලක් බඳුය. උන්ගේ බෙල්ල කඳෙන් වෙන් කර නොහැකි තරම් මහතය. ඌරු රංචුව නිතරම ඉව අල්ලමින් පොළොවේ වලවල් හාරමින් ගමන් ගත්හ.

| දිනය: 2024.07.10, 11 | වේලාව: ප.ව. 9.00 |
| --- | --- |
| කාලගුණය: තද සුළඟ | ස්ථානය: උඩු මහල |

## ඇරුම පුදුම වවුලා



මම සට පට ගා ශබ්දයක් ඇසුණි. අහස දෙස බැලූ විට මා දුටුවේ කළුම කළු වවුලන් ය. මට නම් සිතුණේ වවුලන් කුඩයක් වැනි කළු තටු සහිත මීයන් කියාය. ඇස් නොපෙනෙන වවුලන් පියාඹන්නේ කෙසේද?

හිසින් පිටතට නෙරා ආ තරමක් විශාල කන් ඇති වවුලන් දුටු මට සිහි වුයේ ලුයි බ්‍රේල්ගේ කතාවයි. අන්ධ ලුයි වාගේම වවුලන් උන් ඉදිරියේ ඇති බාධක හඳුනා ගන්නේ පරාවර්තනය වන උන්ගේ ම ශබ්දයට ඇහුම්කන් දීමෙනි. උන් නිකුත් කරන්නේ මිනිස් කනට ඇසෙන්නේ නැති පරාසයක ශබ්දයකි.

මා බලා සිටි විට වවුලන් කිහිප දෙනෙක් අඹ ගසේ අත්තක යටිකුරුව සිටියහ.

| දිනය: 2024.07.12, 13 | වේලාව: ප.ව. 9.00 |
| --- | --- |
| කාලගුණය: උණුසුම | ස්ථානය: ගෙවත්ත |

**ඉත්තෑවා**



වත්තේ වැටී තිබුණු පොල් ගෙඩියක් ඉතා හොඳින් ලෙලි ගසා තිබුණා. එදා රැයේ ශබ්දයක් ඇසුණු නිසා මම වත්ත දෙස බලන විට දුටුවේ පොල් ලෙලි ගසන ඉත්තෑවායි. මම දුටු ඉත්තෑවාගේ ස්වරූපය......

") දුඹුරු පාට ලොම්වලින් වැසුණු කඳක් ඇත.
ඉ) ඉතා කුඩා රෝස පාට නහයක් හා කන් දෙකක් තිබිණි.
ජ) ඉතා කුඩා ඇස් දෙකක් ඇත.
ා) කළු සහ සුදු මෝස්තරයක් සහිත තියුණු කූරු ඇත.
ැ) සුදු පැහැති දිග කොණ්ඩයක් ඇත.
ං) දිග වක් වූ නියපොතු තිබිණි.

★ පොල් ගෙඩි ලෙලි ගසන ඉත්තෑවා දුටු මම උන්ට ශක්තිමත් දත් තිබෙන බව සොයා ගතිමි

| | |
|---|---|
| දිනය: 2024.07.12, 13 | වේලාව: ප.ව. 9.00 |
| කාලගුණය: උණුසුම | ස්ථානය: ගෙවත්ත |

## ඉත්තෑවා





නිවස අසල තිබුණ පොකුණ අසල බකමූණෙක් සිටියේ ය.
ඌ නිරීක්ෂණය කළ විට මා දුටු දෑ....


a) ඌට ගොදුරු අල්ලා ගැනීමට ශක්තිමත් පාද දෙකක් ඇත.
b) ඌට විශාල දීප්තිමත් ඇස් දෙකක් තිබිණි.
c) ඌ හිස අංශක 180 කට පමණ හරවා තිබිණි.
d) ඌ ඉගිළී යන විට අනිත් කුරුල්ලන්ට වඩා තටු ගසන වාර ගණන වැඩියි.
ඌ තටු ගසන විට ශබ්දයක් නිකුත් වෙයි.

★ මේ බකමූණා මාළු ඇල්ලීමට මෙතන සිටිනවා දැයි මට සිතුණි. මෙය තව දුරටත් සොයා බැලීම මාගේ අරමුණයි

| | |
|---|---|
| දිනය: 2024.07.16 | වේලාව: ප.ව. 9.00 |
| කාලගුණය: මද වැසි | ස්ථානය: ගෙවත්ත |

## ගෙම්බා





රාත්‍රියේ ඇසෙන ශබ්දවලින් අමුතු ශබ්දයක් සොයා මම ගියෙමි. එම .ක්‍රීක්... ක්‍රීක්. ශබ්දය පතුරවන්නේ රැහැයියෙකු යැයි මට සිතුණි. නමුත් සිටියේ ගෙම්බෙකි. මා නිරීක්ෂණය කළ දේ....

a) ගෙම්බා සිටියේ ගසක පෘෂ්ටිමත් කොළයක් මතය.

b) ඌට නෙතමනය සහිත දුඹුරු පැහැති සමක් තිබිණි.


c) ඌට දීප්තිමත් කළු පාට ඇස් දෙකක් තිබිණි.

d) හොඳට ඇලී සිටීමට පාදයේ ඇඟිලි තුඩුවල වෘත්තාකාර කොටසක් තිබිණි.

e) ගෙම්බා ශබ්ද කිරීමේදී මුඛය විවෘත නොකරයි. යටි හනුව පිම්බෙයි. ස්වර තන්තු පිම්බෙන විට ශබ්ද පිටවෙන බව මම අන්තර්ජාලයෙන් සොයා ගතිමි

| | |
|---|---|
| දිනය: 2024.07.17, 18 | වේලාව: ප.ව. 8.45 |
| කාලගුණය: සීතල | ස්ථානය: ගෙවත්ත |

## නිදන ගස්



රාත්‍රී කාලයේ දී මම ශාක කිහිපයක් නිරීක්ෂණය කළෙමි. සමහර ශාකවල පත්‍ර හැකිලී තිබුණි. නමුත් උදෑසන ඒවා දිග හැරී තිබුණි. මම එයින් ශාක ද නිදන බව සොයා ගතිමි.

උදාහරණ: නිදිකුම්බා, කතුරුමුරුංගා

වැඩිදුර සොයා බැලූ මට මෙම සංසිද්ධිය 'Nyctinasty' යන නමින් හඳුන්වන බව සොයා ගතිමි.

එයට හේතු කිහිපයක් නම්:

සතුන්ගෙන් පත්‍ර ආරක්ෂා කර ගැනීමට.

විජලනය වළක්වා ගැනීමට.

උෂ්ණත්වය පාලනය කර ගැනීමට.

| | |
|---|---|
| දිනය: 2024.07.20 | කාලගුණය: සීතල |
| වේලාව: ප.ව. 9.00 | ස්ථානය: ගෙවත්ත |

## නිශාචර ලෝකය සුවඳවත් කරන මල්



මම රාත්‍රියේ වත්ත නිරීක්ෂණය කළ විට සමහර ගස්වල මල් පිපී තිබුණා.

රෑටත් මල් පිපෙනවාද? ඒ ඇයි?

රෑට පිපෙන මල් සතුන්ට පෙනීමට අලංකාර සුදු පැහැයක් ගනියි.


වඩාත් හොඳින් සතුන් ආකර්ෂණය කර ගැනීමට රාත්‍රී කාලයේ පිපෙන මල් වැඩියෙන් සුවඳ හමයි.

රාත්‍රියේ මා දුටු මල්: ★ සේපාලිකා

සමන් පිච්ච

| දිනය: 2024.07.20, 21 | වේලාව: ප.ව. 9.00 |
|---|---|
| කාලගුණය: වළාකුළු | ස්ථානය: මුළුතැන්ගෙය |

## සඳ - පෘථිවිය






පුර සඳ දිනවල මම සඳ නිරීක්ෂණය කළෙමි. සඳෙහි ලක්ෂණ:-

a) වෘත්තාකාරයි.
b) අළු පැහැති ආවාට (ලප) සහිතයි. / අනිත් ටික සුදුයි.
c) ආවාට එක් වූ විට ඉහළ බලා සිටින හාවෙකු සේ පෙනේ.

සෑම පුර පොහෝ දිනකම සඳෙහි ආවාට එකම ආකාරයට පෙනෙයි. සඳ භ්‍රමණය වේ නම් එසේ වෙන්නේ කොහොම ද?

★ එයට හේතුව සඳ භ්‍රමණය වීමට ගන්නා කාලය හා පරිභ්‍රමණය වීමට ගන්නා කාලය එකම වීමයි. එය දින 27.3 කි. තව ද ලෝකයේ කොහේ සිටියත් අපට පෙනෙන්නේ සඳේ එකම පැත්තයි.
මෙය මම පාසලේ තාරකා විද්‍යා සංගමයෙන් ඉගෙනගත්තෙමි

| | |
|---|---|
| දිනය: 2024.07.21 | වේලාව: ප.ව. 9.00 |
| කාලගුණය: මද වැසි | ස්ථානය: උඩු මහල |

**දැනුණු දේ**




රාත්‍රියේ මම පුටුවක වාඩි වී ඇස් වසා ගෙන දැනෙන දේට අවධානය යොමු කළෙමි. මට දැනුණු දේ.......

a) සීතල

b) සුළඟ


c)පිනි පොද

d) රෝම කූප සෙලවීම

e) කැසීම

| | |
|---|---|
| දිනය: 2024.07.22, 23, 25 | වේලාව: ප.ව. 9.00 |
| කාලගුණය: උණුසුම් | ස්ථානය: උඩු මහල |


## සඳ - වෙනස් වන හැඩය




මම දිනපතා රාත්‍රියේ සඳ නිරීක්ෂණය කළෙමි. සෑම පෝය දිනක ම මම සම්පූර්ණ සඳම දුටිමි. නමුත් වලාකුළු ඇති විට සඳ නොපෙනී යයි. ඇතැම් විට සඳ රැස් වලාකුළු අතරින් පෙනේ. පුර සඳ ඇති විට රාත්‍රී කාලයේ ඇවිදීමට පවා හැකි මඳ ආලෝකයක් තිබිණි. පුර හඳ පහු වී දිනෙන් දින ගත වෙත්ම සඳ ටිකෙන් ටික නොපෙනී යයි. අඳුරු වන කොටස කවාකාර කොටසක් බව මම දුටිමි. සමහර දිනවල සඳ මම දුටුවේ නැත. ඒ අමාවක දවසක් බව මම සොයා ගතිමි. අමාවක දිනෙන් පසු සඳ නැවත පිරෙයි. එසේ පිරෙන්නේ සඳ වැසුණු පැත්තට විරුද්ධ පැත්තෙනි.

| | |
|---|---|
| දිනය: 2024.07.26 | වේලාව: ප.ව. 9.00 |
| කාලගුණය: උණුසුම් | ස්ථානය: උඩු මහල |

## සඳෙහි - ඡායාරූපය





මම පෝය දිනක පුර සඳෙහි ඡායාරූපයක් ගෙන නිරීක්ෂණය කළෙමි. මම දුටු ලක්ෂණ :-

a) සඳ තද සුදු පැහැයෙන් දිලිසුණි.

b) පළමුවෙන් ම සඳ වටා ලා සුදු ආලෝකයක් තිබුණි.

c) දෙවනුව සඳ වටා කහ වර්ණයේ සිට තද රතු හා මුසු වූ තැඹිලි වර්ණයෙන් ආලෝකයක් තිබුණි.


d) ඉන්පසුව නිල් පැහැති සිහින් වළල්ලක් ඇත.

e) කතිරයක ආකාරයට සඳේ දෙපැත්තෙන් ආලෝක කදම්බ 4ක් විහිදී ඇත.

මෙයට හේතුව: සඳේ ආලෝකය අහසේ තිබෙන කුඩා අයිස් අංශු හ[illegible]නා වර්තනය වීමයි. මෙය මම මා කියවූ පොතකින් සොයා ගතිමි.

| | |
|---|---|
| දිනය: 2024.07.27, 28 | වේලාව: ප.ව. 8.45 |
| කාලගුණය: මද සුළඟ | ස්ථානය: උඩු මහල |

## තරු හා ග්‍රහලෝක I



මම රාත්‍රියේ අහසේ තරු නිරීක්ෂණය කළෙමි. එහි දී සමහර තරු නිවි නිවි දැල්වුණි. තවත් සමහර ඒවා දැල්වී තිබුණි. මම දැන සිටි පරිදි........

- නිවි නිවි දැල්වෙන තාරකා - සූර්යයෝ (තරු)
- දැල්වී ම තිබෙන තාරකා - ග්‍රහලෝක

මාගේ දැනුම අනුව මෙයට හේතුව:

- නිවි නිවි දැල්වෙන සූර්යයෝ - තමාගේම ආලෝකය විහිදුවන නිසා
- දැල්වී තිබෙන ග්‍රහලෝක - සූර්යයාගේ ආලෝකය පරාවර්තනය වන නිසා

මෙය සත්‍යය නොවන බව මම සොයා ගතිමි

| | |
|---|---|
| දිනය: 2024.07.29 | වේලාව: ප.ව. 9.00 |
| කාලගුණය: මද සුළඟ | ස්ථානය: උඩු මහල |

## තරු හා ග්‍රහලෝක II



එසේ නම් සත්‍යය කුමක් ද? තාරකා නිවි නිවි දැල්වීමටත් ග්‍රහලෝක දිගටම දැල්වී තිබීමටත් හේතු වන්නේ...

- **නිවි නිවි දැල්වෙන සූර්යයෝ :**
තාරකා පෘථිවියට ඉතා ඈතින් පිහිටා ඇත. එහි සිට පෘථිවිය දෙසට ගමන් කරන ආලෝක කදම්භ වායුගෝලයේ විශාල පරාසයක වර්තනයට හා චලනයට ලක් වෙන නිසා.

- **දැල්වෙන ග්‍රහලෝක :**
ග්‍රහලෝක පෘථිවියට සාපේක්ෂව ආසන්නයේ පිහිටා ඇත. එබැවින් ඒවායෙන් නිකුත් වන ආලෝකය පෘථිවිය දෙසට පැමිණෙන්නේ කුඩා වායුගෝල පරාසයක් හරහාය. එබැවින් එය වර්තනයට හා චලනයට ලක් වන්නේ සුළු වශයෙනි.

| | |
|---|---|
| දිනය: 2024.07.30, 31 | වේලාව: ප.ව. 9.00 |
| කාලගුණය: මද වැසි | ස්ථානය: ගරාජය |

## වර්ණවත් තරු




මම රාත්‍රියේ තාරකා නිරීක්ෂණය කළෙමි. මම කහ, සුදු, රතු, නිල් සහ තැඹිලි වර්ණයේ තාරකා දුටිමි.

මෙයට හේතුව මම සොයා ගතිමි.

- හේතුව වන්නේ එම තාරකා වල මතුපිට උෂ්ණත්වයයි.
- නිල් පාට තාරකා උෂ්ණත්වය වැඩිම ඒවා වේ.
- රතු පාට තාරකා උෂ්ණත්වය අඩුම ඒවා වේ.
- මධ්‍යම උෂ්ණත්වයක ඇති ඒවා තැඹිලි, සුදු හෝ කහ විය හැකිය.

| | |
|---|---|
| දිනය: 2024.08. 01, 02, 04, 05 | වේලාව: ප.ව. 8.45 |
| කාලගුණය: මද වැසි | ස්ථානය: ගරාජය |

## තරු රටා




මම රාත්‍රියේ තරු නිරීක්ෂණය කළෙමි. එවිට මම තනිවම තිබෙන තරු හා පොකුරු වශයෙන් තිබෙන තරු දුටිමි. ඒ අතර මම තරු රටා කිහිපයක් හඳුනා ගනිමි. එම තරු රටා වන්නේ :-

a) දඩයක්කාරයා (ORION)


b) මිථුන (GEMINI)

c) සිංහ (LEO)

තරු රටා සම්බන්ධව මම පාසලේ තාරකා විද්‍යා සංගමයෙන් ඉගෙන ගතිමි.

| දිනය: 2024.08.10, 11, 12, 14 | වේලාව: ප.ව. 9.00 |
|---|---|
| කාලගුණය: උණුසුම් | ස්ථානය: ගරාජය |

## කෘත්‍රිම - ආකාශ වස්තු




කෘත්‍රිම ආකාශ වස්තු නිරීක්ෂණය කිරීම පහසු නොවේ. ඒ සඳහා දීර්ඝ වේලාවක් අහස දෙස විමසිලිමත්ව බලා සිටිය යුතුය. මා දුටු කෘත්‍රිම ආකාශ වස්තු.

a) චන්ද්‍රිකා - ගමන් කරන තාරකාවන් වගේ.

b) ගුවන් යානා - එකට ම දැල් වී, වෙනස් නොවන දුරකින් දිස් වන එළි තුනක් හා නිවි නිවී දැල්වෙන තවත් එළියක් ඇති වස්තුවක් ලෙස දිස් වේ. දෙදරමින් එක දිගට ශබ්දයක් ඇසෙයි.

c) හෙලිකොප්ටරය - එක දිගට දැල්වෙන එකම රේඛාවක පිහිටි එළි 2 ක් මැද නිවි නිවී දැල්වෙන රතු පැහැ එළියක් දිස් වේ. කැඩි කැඩී ඇසෙන තිව්‍ර ශබ්දයක් ඇසේ.

d) සරුංගලය - බල්බ වලින් අලංකාර කළ සරුංගලයක්.

| | |
|---|---|
| දිනය: 2024.08.15 | වේලාව: පෙ.ව. 6.00 |
| කාලගුණය: උණුසුම් | ස්ථානය: උඩු මහල |

## රාත්‍රිය නිමා වෙයි





මම උදෑසන ම හිරු උදාවන අයුරු බලා සිටියෙමි. එවිට මා දුටු වෙනස්කම්, රාත්‍රියේ නිමාව මට පැහැදිලි කර දෙන ලදී.

a) අන්ධකාරය නැති වෙමින් හිරු එළිය කඳු අතරින් විහිදෙයි.

b) සූර්ය කදම්භ වෙන වෙනම පෙනෙයි.

c) අහස දීප්තිමත් තැඹිලි පැහැයක් ගනී.

d) හිරු අහසට නැගෙයි.

මෙලෙස අරුම පුදුම නිශාචර ලෝකය නිමාවට පත් වෙයි.

## නිගමනයන්


1. හිරු නැග ඒමත්, බැස යාමත් අප සිතනවාට වඩා සුන්දරයි.

2. රාත්‍රී කාලයට හැඩ ගැසුණු සතුන් රාශියකි.

3. රාත්‍රියට පිපෙන මල් සුදු පාටයි, සුවඳින් වැඩියි.

4. රාත්‍රී කාලයේ දී සතුන්ගේ හා ශාක වර්ගවල චර්යාව වෙනස් වේ.

5. රාත්‍රී කාලයට කුඩා අපි බය වුණත් එය නිශ්චලයි සුන්දරයි



## අත්දැකීම් සහ දැනුම


1. කළුවරට තිබෙන බිය අඩු වී යාම.

2. ඉවසීමෙන් නිරීක්ෂණය කිරීමට පුරුදු වීම.

3. හිරු බැස යාමේ දී අහසේ වර්ණය වෙනස් වීමට හේතු.

4. රාත්‍රී කාලයේ දී සමහර ශාකවල පත්‍ර හැකිලීමට හේතු.

5. සඳ භ්‍රමණය වීමට සහ පරික්‍රමණය වීමට ගත වන කාලය සමාන බව්



## ගැටලු සහ නිරාකරණය කරන උපක්‍රම

රාත්‍රියට ඇති බිය :- අඳුරට හුරු වීම.


සඳේ සියුම් තොරතුරු පියවි ඇසට නොපෙනීම :- දුරදක්නය භාවිතය.

රාත්‍රියේ ගැවසෙන සතුන් සෙවීමට අපහසු වීම :- සතුන්ගේ ශබ්ද සොයා යාම.

දකින ජීවීන්ගේ නම් නොදැන සිටීම :- Google lens භාවිතා කර සොයා ගැනීම.

රාත්‍රියේ ජීවීන් පැහැදිලිව නොපෙනීම :- විදුලි පන්දම භාවිතය.

රාත්‍රියේ අවදි වී සිටීමට අපහසු වීම :- සවස් කාලයේ කෙටි නින්දක් ගැනීම.



## පරිසර අධ්‍යයනය ආශ්‍රිත අනාගත සැලසුම්

රාත්‍රිය සුන්දර කරන තාරකා නිරීක්ෂණයට මම කුඩාම කාලයේ සිට ප්‍රිය කළෙමි. එමෙන් ම සතුන්, ශාක සහ අහස වැනි පරිසරයේ දසුන් ගැන සොයා බැලීමට මගේ සිත තුළ කුතුහලයක් ඇති විය. එම නිසා අනාගතයේ තාරකා විද්‍යාව හා පරිසරය පිළිබඳ ගවේෂණය කරන නිර්භීත විද්‍යාඥවරියක් වීම මාගේ බලාපොරොත්තුවයි





# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)